සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

58920

AL/2011/71/S-I

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

| | | | |
|---|---|---|---|
| සිංහල I<br>சிங்களம் I<br>Sinhala I | 71 S I | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

උපදෙස්:

* පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. පහත දක්වෙන උද්ධෘත කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොද ගන්න.)

(අ) එවේලෙහි පුරෝහිතයා කී බස් අසා මහලු පුරුෂ කියනුයේ "බ්‍රාහ්මණය, අධර්මිෂ්ඨ රජහු විසින් අනුශාසනා කරන ලද මේ රාජ්‍යය, විචාරයක් නැති බව හේතු කොට ගෙන අධර්මිෂ්ඨයෙන් ගන්නා කරවුඩරයෙන් පෙළෙන ලද රාජ්‍යවාසීන් දවල් දවස රාජ සේවකයන් විසින් බොහෝ වධ බන්ධනයට පමුණුවන ලද්දහු රාත්‍රියෙහිදු සොරුන් විසින් කොල්ලකා හොයෙස් ව්‍යසනයට පමුණුවන ලදුව දවල් දවස දෙර, සිටීන් භයා බැඳ අඹුදරුවන් හා සමඟ වල් වැද සැඟවී රෑ දවස සොරුන් කෙරෙහි භයින් ගෙවලට අවුත් ගෙයි ලගිති. මාත් එසේ ම දවල් වල හිඳ දන් අවුත් දෙරනඩ ගැසූ කටු හැර දමන වේලෙහි මා, සැදූ කටු ඇනුණේ යයි කියා රජ්ජුරුවෝ දැහැමින් රාජ්‍යය කරන්නාහු වී නම් අමාත්‍ය සේවකාදීහු එපරිද්දෙන් ම ධර්මිෂ්ඨයස හ. ඔවුන් ධර්මිෂ්ඨ වූවහොත් සත්ත්වයන්ට අන්‍යාය නො වදී නම් සත්ත්වයෝ වල් නොවැද තම තමන්ගේ ගෙයි සැපසේ දරුවන් උකුලෙහි නටවමින් විභවානුරූප වූ පරිද්දෙන් වසන්නාහු රජ්ජුරුවන් නිසා වේ ද අප සැප සේ වසන්නේ යයි රජු දීඝායු ව සුව විඳව යි ආවඩ වඩා ඉඳිනාහ.

(i) 'සොරුන් කෙරෙහි භයින්' මෙහි 'භයින්' යන්නෙහි ව්‍යාකරණ ලක්ෂණ දක්වනන.
(ii) රටවැසියන්, අඹුදරුවන් රැගෙන වල් වැදීමට හේතුව කුමක් ද?
(iii) රටවැසියන් දහවල සහ රැය ගත කළේ කෙසේ ද?
(iv) 'කරවුඩරයෙන්', 'විභවානුරූප' යන වචනවල අර්ථ සපයන්න.

(ලකුණු 04 යි)

(ආ) උන් සොළොස්හැවිරිදි වයසැදී මිථ්‍යාචාරයෙන් නවතනු නිසා සත්මාල් පායේ උඩු මාලේ ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එසේ වුවත් ඌ තුමූ තමන්ගේ ම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. උන්ගේ දෙමව්පියෝ ජාතීනුත් සම්පත්තීනුත් සම තරම් වූ සිටුපුත්‍රයාණ කෙනෙකුන්ට සරණ දෙන්ට නියම ව දවස් නියම කළහ. නකත්දවස් උදා වූ කලට සිටුදුවණියෝ බැඳී වසන කොල්ලාට කියන්නෝ 'මා අසවල් දවස් අසවල් සිටුපුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඬුරන් හැරගෙන ගිය නමුත් ඔබිනුත් වෙන ම රකවල් හෙයින් දක්නා පමණකටත් නොලබව. ඉදින් මා කෙරේ ප්‍රේමයෙක් ඇත්නම් ඔබ නොයන තෙක් දන් ම මා කැඳවාගෙන කැමති තැනකට යව' යි කීවුය. උයින් යහපතැයි ගිවිස 'එසේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි. තුඹත් එක් උපදෙසකින් සාටත් නොහැඟෙනා ලෙස එතැනට අවමැනවැ' යි කියාලා දෙවනා දවස් කියාලූ තැන ම සිටියහ. සිටුදුවණියෝ ද දෙවනා දවස් කිලුටු අදනය් සේ ම කිලුටු සාටරෙද්දක් කොයින් දේ සොයා හැඳගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳගෙන රෑ දෙවරු වී පැහැරියා සේ ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව ගෙන් පිටත් ව මිඩිවෙස් ගත් ලෙසට කොල්ලා සිටි තැනට ගියහ.

(i) උන් සත්මාල්පායේ උඩුමාලේ ශ්‍රී යහන් ගබඩාවේ තබා ආරක්ෂා කළේ කවර හෙයින් ද?
(ii) ඇය කොල්ලා සමඟ යන්නට තීරණය කළේ කවර හේතුවක් නිසා ද?
(iii) දියණිය සරණ දෙන්නට අවශ්‍ය කරුණු ලෙස දෙමාපියන් සිතුවේ මොනවා ද?
(iv) "වී පැහැරියා සේ" යන්නෙහි තේරුම ලියන්න.

(ලකුණු 04 යි)

www.pastpaperlk.com

[ දෙවැනි පිටුව බලන්න.

www.pastpaperlk.com



(ඉ) ස්වාමීනි වඤ්චායින් නැති යම්කිසි සත්පුරුෂයෙක් තමා ස්වභාව හෙයින් මේ මාගේ මිත්‍රයා වේ දැයි සිතා සොර සිත් ඇති අසත්පුරුෂයාට කවර තරම් උපකාරයක් කළේ නමුත් ඒ උපකාරය මදකුත් සඳහන් නොකරන්නේ ම ය. වඤ්චා දන්නා මනුෂ්‍යයෝ එසා තෙන ඉඳ එක් ව නා කී එක් ව වැදහෙව, එක් ව කථා කොට හිඳින් තමන්ගේ චෞරස්වභාවය නොහරනාහු මය. එබැවින් වඤ්චායින් ඇති අසත්පුරුෂ සොරුන් අහසට පොළොව සේ දුරින් ම දුරුකට යුත්තේ ය. වඤ්චා දන්නා සොරහු සිතින් එකක් සිතති, කටින් එකක් කියති, කයින් අනිකක් කෙරෙති. ඉදින් යම්නම් අවසරයක් ලද්දහු වී නම් තමන්ට උපකාර කළවුන්ගේ බාල්‍ය අවස්ථාවෙහි පටන් උපයා රැස් කළ වස්තුව සියල්ල ම ඇරගෙන පලා යන්නාහු ම ය. එබැවින් සොරුන් කෙරෙහි විශ්වාසයක් නැත් මය. සෙස්සන් තබා වැදූ මව්පියන් හා බන්ධුජනයෝ ද බාල අවස්ථාවෙහි පටන් එක කෙළිමඬලෙහි සෙළ ඇවිදි මිත්‍රජනයෝ ද එවා සොරසිත් ඇති අසත්පුරුෂයන් දුර එන්නා දුටත් අනර්ථයක් අවැඩක් කෙරේ දෝ හෝ යි යන භයින් සැකයෙන් දුරින් ම දුරු වන්නාහු ම ය.

(i) සොරුන් විශ්වාස නොකළ යුත්තේ කවර හෙයින් ද?
(ii) අසත්පුරුෂ සොරුන් දුරුකොට යුත්තේ කවරාකාරයට ද?
(iii) වඤ්චා දන්නා. සොරහුගේ ස්වභාවය කෙසේ ද?
(iv) "කෙළි මඬලෙහි සෙළු ඇවිදි මිතුජනයෝ" මෙහි අරුත් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ඊ) (i)
සඳ රැස් වතුරු ලොවු පිරෙමින් බයින ස ද
තුරු හිස් අතුරු රැළි පෙණපෙළ ලෙස විහි ද
එ දවස් උදය වන කුසුමන් දක නොම ද
සිත තොස් වඩා මඳකැත් නො ගොසින් සබ ද

සමග සබළතුරු දිළි පෙණවැළ ලත ළ
තරඟ විපුළ නිල්සිඳුපැහැය පළ ක ළ
සුළඟ උලෙළ දලු මල් තුරු වැළ වත ළ
බලග උදුළ පෙර මඟ වනගළ නැව ළ

(i) උදෑසන වන කුසුමන් කවියා දකින්නේ කෙසේ ද?
(ii) මුහුදෙහි රැළි නැඟීම හා බැසීම කවියා විස්තර කළේ කෙසේ ද?
(iii) 'නිල්සිඳුපැහැය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04 යි)
(iv) "එකගුළු සැඟළු" යන්නෙහි කාව්‍යෝචිත ප්‍රයෝගය පැහැදිලි කරන්න.

(ii) පහත සඳහන් උද්ධෘත ඇසුරෙන් කතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.
(i) "නුඹ ජීවිතයක් වැනි බිසවුනි, මේ මිනිස් ලොව යම් සැපතක් ඇත්නම් එම බොහොව ඇත්තේ ය."
(ii) "එම්බා සොඳුර, තොපට වඩා මට උපකාරී කෙනෙක් නැත්තාහ."
(iii) "කෙපි තාම සස්වාමික කෙනෙක් ද?"
(iv) "ඇයි ඉතින් මෙහෙන් ගියේ? මේක හොඳ පළාතක් නෙ වාසය කරන්න."
(v) "ඉතින් ටිකක් හොයා බැලුවේ නැද්ද?"
(vi) "අනේ මන්ද. අපි ඉතින් ඉවරයි." (ලකුණු 08 යි)

(උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

දහවිය පෙරාගෙන මහ ගවල ගින්නේ
වැලිබත් උයන අවදියෙ ගෙයි පිළිකන්නේ
මා ඇය දුටුව බව ඇය හොඳහොම ද දන්නේ
හඳ වාගෙයි එ ද ඇ බැබලුණු පින්නේ

ඇගෙ නෙත අභිංසක රසයට උල්පත ය
ඇගෙ මොළකැටි ගතිය රැදුණේ මල් වෙත ය
සඳ හිරු පළමු බැලුවේ ඇගෙ පැල්පත ය
එහි හැම තැන ම මිහිරිගෙ සුරතල් වත ය

ඇගෙ නෙත් පහර වැද නාදලු නිලව හැරෙර්
තොල් පැහැ පෙනේ ගම අහයේ බහින ඉරෙර්
පවතී මිහිරි බව ඇගෙ පරිසරය කොරේ
ඇය ඇති තැනදි වැඩි හිමැසී බමර පොරෝර්

www.pastpaperlk.com www.artsapi.lk

ඉන් පසු ඇය දිවිමි නව යොවුනෙහි　　වෙලුණු
රන් තරුවක් වගෙයි කිරි මුහුදෙහි　　ගිලුණු
ඇගෙ යටි පතුලෙ වැදි සක එන තැන　　තැලුණු
වැලි කැට තිබේ පිරියල් පාටට　　දිලුණු

ඇගෙ නෙත් කොනින් ආ මදලස වැද　　පිපුණු
වන මල් ගැන කිහ ගම් සමහර　　ගැහැනු
ඇගෙ කටහඬින් ඉපනැලි තුළ ගොනු　　ගැනුණු
සුම්හිරි තාල කවද වත් නැත　　නැසෙනු

පරිණත යොවුන් වයසේ පිළි බර ව　　සිටි
ඇය මම දිවිමි මුළු ගම බබලවන　　හැටි
හැසිරෙනු දිවිමි රන් රස ආලයක　　වැටී
ඇය දුන් තනි ව විසු දවසට වැඩිය　　වටී

කලකට පසුව යළි මම ඇය දිවිමි　　එද
ආ ගැහැනියකි ඇති දරු සිව්දෙනෙකු　　හද
හළ මෙන් දිවිම් හැම සිරි ඇය වෙතට　　මුද
ඈ සල් ගසක් මෙනි ඇති මල් පොකුරු　　දද

අවසන් වරට මවිසින් ඇය දුටු　　දවස
ඇය පිපිගරා වැලපුණිය හිත ඇති　　පිරිස
සුවා යෝ වෙසෝයි දුරු කරගෙන　　වෙහෙස
සොහොනක් සොළොම් මගෙ හදවත ඇය　　පිණිස

(ලකුණු 10 යි)

2. "ශ්‍රාවක පිරිසකට රසවත් වන ආකාරයෙන් සරල අයුරින් කතාවක් ඉදිරිපත් කිරීම සද්ධර්මරත්නාවලි කතුවරයාගේ අභිමතාර්ථය විය." නිර්දිෂ්ට කථා ඇසුරෙන් විමසන්න.
(ලකුණු 15 යි)

නැතහොත්

"හේතුඵල සම්බන්ධය අනුව සිදුවන සිදුවීම් සහිත කථා ජාතක පොතෙහි බහුලව ඇත. ඒවා ලියවී ඇත්තේ යථාර්ථ ජීවිතයකි." නියමිත කථා දෙකක් ඇසුරෙන් උක්ත කියමන විමසන්න.
(ලකුණු 15 යි)

3. "සද්ධර්මාලංකාර කතුවරයාගේ මුඛ්‍ය අරමුණ වූයේ සමාජය තුළ ගුණධර්ම පෝෂණය කිරීම යි." නියමිත කථා ඇසුරු කොට මෙම කියමන පිරික්සන්න.
(ලකුණු 15 යි)

4. "ගිරා සංදේශ කතුවරයාගේ විශිෂ්ටතාව වන්නේ තැනට ගැළපෙන, කණට මිහිරි වන සුදුසු පද, වර්ණනා සඳහා යොදා ගැනීම යි." වැනුම් දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.
(ලකුණු 15 යි)

5. "ජීවිත ප්‍රශ්නවලට මුහුණ දිය නොහැකි වූ සංවේදී කලාකරුවකුගේ චරිතයක් 'මළගිය ඇත්තෝ' නවකතාවෙන් නිරූපණය වේ." මෙය සැබෑ දැ'යි පිරික්සන්න.
(ලකුණු 15 යි)

6. බලාපොරොත්තුව, විශ්වාසය, ඊර්ෂ්‍යාව, පාරම්පරා ගර්වය වැනි මිනිස් ගුණ නුගුණ නිරූපණය කිරීමට සමකාලීන කෙටිකතාකරුවන් අතිරුචියක් දක්වන්නෝ දැ'යි නියමිත කෙටිකතා තුනක් ඇසුරෙන් විමසන්න.
(ලකුණු 15 යි)

7. "කවියක දී අන්තර්ගතය මෙන් ම සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමට උචිත භාෂා මාධ්‍යයක් යොදා ගැනීම ද වැදගත් වේ." නියමිත පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් විමසන්න.
(ලකුණු 15 යි)

8. "ගැටලු රැසකට මුහුණ දෙමින් සූක්ෂ්ම ලෙස ජීවත් වන චරිතයකි, වාසවදත්තා බිසව." නාට්‍ය පෙළ ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.
(ලකුණු 15 යි)

* * *

www.pastpaperlk.com
www.artsapi.lk

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

AL/2011/71/S-I

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

විභාග අංකය : ..............................

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. අඝෝෂාක්ෂර ලෙස සැලකෙන්නේ කවරක් ද?
(1) ඞ, ඤ, ණ, න, ම
(2) ක, ච, ට, ත, ප
(3) ය, ර, ල, ව
(4) ග, ජ, ඩ, ද, බ
(5) ශ, ෂ, ස, හ, ළ
(.........)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) දෛනික, ග්‍රාහිකා, මර්ද්ධනය, ප්‍රසන්න
(2) නිදර්ශන, ප්‍රශ්න, විස්මය, ශෝචශ
(3) ලේඛණ, සම්ප්‍රදාන, ආස්වාද, කොට්ඨාශ
(4) අර්බුද, ප්‍රස්තාර, ස්ඵුට, නිඝණ්ඨු
(5) සමස්ත, ප්‍රතිඵල, සජ්ඣායනා, දෘෂ්ටි
(.........)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) මාතර, ගාල්ල, මොරටුව, කොළඹ
(2) කඩවත, නිට්ටඹුව, පේරාදෙණිය, මහනුවර
(3) මාතලේ, දඹුල්ල, කැකිරාව, අනුරාධපුරය
(4) තංගල්ල, හෝමාගම, තිස්සමහාරාමය, කතරගම
(5) මැදවච්චිය, වවුනියාව, කිලිනොච්චිය, යාපනය
(.........)

1.4. පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රේඵය යනු සිංහලයේ 'ර්' ශබ්දය වෙනුවට යෙදෙන සංකේතයකි.
(2) රේඵය වෙනත් වර්ණයක් සමඟ නො යොදා තනි ව ම යෙදිය හැකි ය.
(3) රේඵය මූර්ධජ අක්ෂරයක් සමඟ ම භාවිත කළ යුතු ය.
(4) රේඵය වෙනුවට රකාරාංශය වුව ද භාවිත කළ හැකි ය.
(5) වචනයක ආරම්භක අක්ෂරය ලෙස ද රේඵය යෙදිය හැකි ය.
(.........)

1.5. රකාරාංශය, ගයනුකිත්ත, රේඵය හා යංශය සහිත වචන අනුපිළිවෙළින් යෙදී ඇති පේළිය තෝරන්න.
(1) කුම්භක්‍රණය, ගෞතම, චෛත්‍යය, ධණිය
(2) ප්‍රමාණය, වෛද්‍ය, බෞද්ධ, චම්
(3) වෘෂය, නෞකාව, සාමාද්‍ය, ක්‍රමය
(4) චෛත්‍යය, දිසී, සෞන්දර්ය, ප්‍රදානය
(5) වික්‍රමය, ගෘහිකා, ස්වර්ගය, විද්‍යාලය
(.........)

1.6. එකිනෙකට අනුගත වන සේ බැඳුණු යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) සමාජ ප්‍රදානය, පුණ්‍ය මහෝත්සවය, යෞවන කටයුතු, ස්වදේශ ප්‍රවෘත්ති
(2) අවමඟුල් උත්සවය, වෙසතුරු ද, සුබ පැතුම්, මිහි මඬල
(3) ලෝක විනාශය, ව්‍යාකරණ විධි, සිංහ අවලෝකනය, ප්‍රතිපත්ති ප්‍රකාශනය
(4) මනුෂ්‍ය වර්ගයා, අවුරුදු උත්සවය, සදෙව් ලොව, පුණ්‍ය කර්මය
(5) පව් කම, දම් අමා, ප්‍රදීප ආලෝකය, දේශීය වෙදකම
(.........)

1.7. සන්ධි පද පමණක් අන්තර්ගත වරණය කුමක් ද?
(1) මුග්ධ, ප්‍රසිද්ධ, බීම, හිත
(2) කල්පාන්ත, මනෝවිද්‍යාව, ප්‍රශස්ත, අභ්‍යවකාශය
(3) දෙවිඳු, විමසුම, කම්කිරිය, සිදත්සඟරාව
(4) සාරගර්භ, ශ්‍රී විභූතිය, කායෝත්වීත, හදවත
(5) භූමිකම්පා, ආයුර්වේදය, තුරුවැල්, දේවේන්ද්‍ර
(.........)

1.8. මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) සමාන - අතුල්‍ය, විෂම, අසමාන, අසදෘශ
(2) සංවර - නොසන්සුන්, අසංවර, අසංයත, නොදමුණු
(3) ස්ථිර - අස්ථිර, අස්ථාවර, නොතිර, අනිත්‍ය
(4) උත්කෘෂ්ට - නිකෘෂ්ට, අධම, නීච, ශ්‍රේෂ්ඨ
(5) කළු - ශ්වේත, ශුක්ල, ධවල, ශුභ්‍ර
(.........)

1.9. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) සූර්යයා - දිවාකර, රවි, හිරු, සහසයුර
(2) මව - මාතෘ, ජනනී, මයිලා, අම්මා
(3) දද - කුරුල්ලා, කුෂ්ඨය, කොඩිය, අඬදන
(4) අනංගයා - කාමදේව, මල්සර, වියොවග, අනඟ
(5) පද්මය - සියපත, නෙළුම, සහස්පත, සරෝජ
(.........)

[ දෙවැනි පිටුව බලන්න.

www.pastpaperlk.com



1.10. විභක්ති, විශේෂණ, දකාරාර්ථ, අව්‍ය යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.
(1) මිහිපල්, දෙව්දත්තෙර, දුදන, මවුපිය
(2) තෙතුපුල්, කිරිබත්, කෙල්මල්, ප්‍රබල
(3) පුදුමල්, හරක්මස්, දුලද, දිවරැ
(4) සොරබිය, තෙරුවන්, කුකාවි, ඇස්ඉස්මස්
(5) සරාසඳ, අටසිල්, ඉරහඳ, දුසිල්
(.........)

1.11. කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.
(1) නටන, දුවන, හඬන, බමන
(2) බැලූ, කළ, තැ, මැරූ
(3) නැටුම්, ගැයුම්, කැපුම්, බැලුම්
(4) මරණීය, දර්ශනීය, පානීය, පූජනීය
(5) වැටුණු, මැරුණු, කැඩුණු, රැකුණු
(.........)

1.12. පහත සඳහන් වැකිවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
* මිනිසා ගෙදර **ගොස්** බත් කෑවේ ය.
* දරුවා සඳ **ඉල්ලමින්** අඬයි.
* අම්මා මෙහෙකාරිය ලවා රෙදි **සෝදවයි**.
* ඔබ **පැමිණෙතොත්** මම ද එන්නෙමි.
(1) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා
(2) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, මිශ්‍රක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා
(4) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා
(5) මිශ්‍රක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා
(.........)

1.13. අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක් ඇති පේළිය තෝරන්න.
(1) දරුවන්, මිනිසුන්, වඳුරෝ, කාන්තාවන්
(2) මැණියන්, පියාණෝ, තොප, දෙවහනක
(3) වනිතාවන්, මාතාවන්, කුමාරතුංගයන්, මා
(4) බල්ලෙක්, ගොනකු, දෙවියකු, බඹකු
(5) තා, අප, හිහත්තන්, ඇවිදින්නෝ
(.........)

1.14. උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) සානුකම්පික, ප්‍රබල, ප්‍රත්‍යුත්තර, දුගන්ධ
(2) නිරනුනාසික, සමලංකෘත, අග්නි, විගමන
(3) දුර්ගුණ, උදුල, ආයාචන, සම්බාධක
(4) දුබල, අනුමෝදනා, අවමානය, සම්මානය
(5) අත්‍යලංකාර, නිරාහාර, පිළිගනී, විලාප
(.........)

1.15. 'සිව්මත් බඹ පිරයෙහි පා පිසිනා
සැරියුත් මහමුගලන් පිළිවෙළිනා'
යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් ඇති පද අයත් වන්නේ මින් කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) තද්ධිත, සන්ධි හා සමාස පදවලට ය.
(2) තද්ධිත, සමාස හා සන්ධි පදවලට ය.
(3) සන්ධි, සමාස හා තද්ධිත පදවලට ය.
(4) සන්ධි, තද්ධිත හා සමාස පදවලට ය.
(5) සමාස, සන්ධි හා තද්ධිත පදවලට ය.
(.........)

1.16. ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක් ද?
(1) දෙව්ලොව, අසුර, රතුපුල්, දසබල
(2) හෛතික, නෛතික, ඖදර්ය, සාම්‍ය
(3) කරන, සරන, පුරන, මරන
(4) ශ්‍රේෂ්ඨෝත්තම, මනුෂ්‍යාත්මය, මහෞෂධ, ප්‍රත්‍යුපකාර
(5) මෙන්, සේ, එව්, අව
(.........)

1.17. සමාස පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
(1) ගොල්හෙල්, වනමල්, මුහුදුදිය, බවදුක්
(2) තිසරණ, නවදෙර, පන්සිල්, සිවුසස්
(3) හිරසඳ, මව්පිය, ගන්වැල්, බඹසුරනර
(4) අසරණ, කුකාවි, කුකුස, උපලේකම්
(5) සුරලොව, එළුමස්, බුදුදහම, රජසිරිය
(.........)

1.18. එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) ගංවතුර, නෙළුම්මල්, තම්පලා, සම්මාන
(2) වෙදහිල්ල, වසරයින්, පදෙව්, සුරිඳු
(3) ඔවුහොවුන්, වමන, දකුණත, මලයුත
(4) දඩුවම්, ගිනියම්, බුත්සරණ, කම්මල
(5) ගමනාගමන, ගුණාගුණ, කුශලාකුශල, වාගාලය
(.........)

1.19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.
(1) දරුවෝ පොඩන ගොස් ඇත.
(2) සත්තු සඳහා වෙන් වූ උද්‍යානයක් දෙහිවල තිබේ.
(3) අපි දෙවියන් පුදනු ලබමු.
(4) තරු පෙළ සැදූ අහසේ බැබළෙණේ ය.
(5) ඔවුන් තරගය ජයග්‍රහණය කරත්වා!
(.........)

1.20. වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.
(1) ප්‍රශස්තවූ රාජ්‍ය පාලනයක් සඳහා දශ රාජ ධර්ම අනුගමනය කිරීම පෙර සිරිත විය.
(2) ඇත් අස් රිය පාබළ යනු චතුරංගිනී සේනා ව වුයේ ය.
(3) බුද්ධි මත්, නිරෝගී මත්, ආචාර වත් ජනතාවක් බිහි කිරීම වැදගත් ය.
(4) බලලෝභීත්වය නිසා නිරන්තරයෙන් ම ලෝකයේ විවිධ අරගල ඇති වෙයි.
(5) පුරාණභාරතයේවූ කලී රසකාමීවූත් සාහිත්‍යකාමීවූත් ජන සමූහයක් වාසය කළ රටක් විය.
(.........)

(ලකුණු 20 යි)

[ තුන්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com www.artsapi.lk

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2011 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2011 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2011

| | | |
|---|---|---|
| සිංහල | II | 71 S II |
| சிங்களம் | II | |
| Sinhala | II | |

## II කොටස

2\. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුසිරිමෙළින් ලංකාවේ රාජධානි බවට පත් වූ පුරප්‍රවරයන්ගේ නාම අනුව සිංහල සාහිත්‍යය ද සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදේ. මේ යුග වෙන වෙන ම තුලනාත්මක පරීක්ෂණයට භාජන කිරීම මෙහි දී අවශ්‍ය නො වේ. එසේ වුව ද අනුරාධපුර යුගයට අයත් වන පද්‍ය සාහිත්‍යය වශයෙන් සීගිරි පවුරු ගී ද කාව්‍යාලංකාර ග්‍රන්ථයක් වන සියබස්ලකර ද හැර අන් කිසිදු කෘතියක් දක්නට නො ලැබෙන බව මෙහි දී සඳහන් කළ යුතු ය. සීගිරි ගීවල දක්නට ලැබෙන කාව්‍ය ආකෘති සිය පබැඳුම්හි යොද ගත්තෝ විරලය හ. ඉඳුදු අප දන්නේ පසු කාලයෙහි ඇති වූ කවීන් තිදෙනකු පමණි. ඔවුහු නම්, ගී කාව්‍ය නමින් ව්‍යවහාර ලැබූ ආඛ්‍යාන කාව්‍ය තුනෙහි කර්තෘවරු ය. කව්සිළුමිණ, සසදවත, මුවදෙව්දවත යන මේ කාව්‍ය තුන පරීක්ෂා කර බලන විට කවීන් තිදෙන ම සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනයෙහි ලා නොමඳ ව නියැළී ඇති බව හෙළි වෙයි. සංස්කෘත බලපෑමට හසු වූ ගී කාව්‍ය කර්තෘවරු දේශීය ලක්ෂණ විරල වූ ගතානුගතික කාව්‍ය වර්ණනා පබැඳූ හ. ඔවුහු ස්වභාව ධර්මය කෙරෙහි මහත් අභිරුචියක් දැක්වූ නමුත් ස්වකීය දේශීය පරිසරයෙහි දක්නට ලැබුණු ස්වභාව සෞන්දර්යයෙන් ප්‍රබෝධයක් ලැබූ බවක් සිය පබැඳුම්න් ස්ඵුට නො කරති. සංස්කෘත කාව්‍යයෙහි හමු වූ ප්‍රකාශන ක්‍රම සහ විවිධ අලංකාර රීති ද ඔවුහු ලැදි ව අනුගමනය කළ හ. රජුන්, රැජිනන්, නගර, උත්සව, ස්වභාව වස්තූන් ආදිය පිළිබඳ ඔවුන්ගේ අනේකවිධ වර්ණනා සියල්ල ම සම්පූර්ණයෙන් ම වාගේ ඒකාකාර ය. වෙනසක් පෙනෙන්නේ උපමා ඈතුළු අලංකරණ සකස් කර තිබෙන ආකාරයෙහි පමණි.

(i) ගී කාව්‍යයන්හි ඒකාකාරිත්වය හා වෙනස්කම් මතුවන්නේ කවර අංග ආශ්‍රිත ව ද?

(ii) ගී කාව්‍ය කතුවරුන් සංස්කෘත කාව්‍යාලංකාරිකයන් අනුගමනය කළ බව තහවුරු වන්නේ කවර කරුණු නිසා ද?

(iii) සීගිරි ගී සහ සියබස්ලකර පිළිබඳ ව සඳහන් කිරීමෙන් ලේඛකයා තහවුරු කරන්නේ කුමක් ද?

(iv) මෙම ඡේදයේ සඳහන් අන්දමට සිංහල සාහිත්‍යය සම්ප්‍රදායානුකූල ව ඓතිහාසික යුගවලට බෙදා ඇත්තේ කුමක් පදනම් කරගෙන ද?

(v) පුරප්‍රවරයන් හා තුලනාත්මක යන වචනවල අරුත් පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

ආර්ථික විශ්ලේෂණයේ දී වෙසෙසින් උළුවා නො දැක්වෙන නමුත් සංවර්ධනයේ දී අතිශයින් වැදගත් වන තවත් සැලකිය යුතු කාරණයක් නම් අධ්‍යාපනය සමාජ වෙනස්වීම් සඳහා සාධකයක් ලෙස බලපවත්නා ආකාරයයි. සංවර්ධනයේ දී පාරම්පරික සමාජ ව්‍යුහයේ පරිණාමයක් අවශ්‍ය වෙයි. තවද, ඒ සඳහා වැඩි වේගවත් සමාජ චලතාවක් ද, නව්‍යකරණයට බාධක වන සිරිත් විරිත් සහ ඇගයීම් බැහැර කිරීම ද අවශ්‍ය වෙයි. මේ වෙනස්වීම් ඇති කර ලීමෙහි ලා අධ්‍යාපනය බලවත් උපකරණයකි. අලුත් අදහස් පැතිරවීමෙන් ද, අලුත් උසස් සමාජ පන්ති පෝෂණය කරලීමෙන් ද මුළු සමාජය පුරාම නායකත්වය පිළිබඳ විවිධ රටාවන්හි වෙනස්කම් එයින් ජනිත කෙරේ. ක්‍රම සම්පාදකයෝ සංවර්ධනය හා සම්බන්ධ සමාජ සහ දේශපාලන සාධක දන්නා තරමට ම, සමාජ වෙනස්වීම් ඇති කරලීමේ මාධ්‍යයක් වශයෙන් අධ්‍යාපනයේ ඇති වැදගත්කම ගැන ද දැන ගත යුත්තෝ ය.

අධ්‍යාපනය ශුභසාධන අංශයක් වශයෙන් නො ව සංවර්ධනයෙහි ලා අතිශයින් උපකාරී වන්නක් සේ අද සැලකෙන්නේ නම්, එය ප්‍රබල සහ කාර්යක්ෂම ආයුධයක් බවට පත් කර ගත යුතු ය. මෙයින් අදහස් කෙරෙන්නේ අධ්‍යාපනය මුළුමනින් ම වාගේ සංවර්ධන පරමාර්ථයේ අවශ්‍යතා අනුව හැඩගස්වා ගත යුතු බව යි. මූලික වශයෙන් මේ අවශ්‍යතා දෙයාකාර වෙයි. සංවර්ධනයේ උසස් තලවල දී ආර්ථිකය සඳහා අවශ්‍ය වන විශේෂ දක්ෂතාම් ඇතියවුන් නියත වශයෙන් ලබා දීම ඉන් පළමු වැන්න වේ. නවීන කාර්මික ක්‍රමය ගැන ජනතාව තුළ පිළිගැනීමක් මෙන් ම නවීන වූත්, විද්‍යාත්මක වූත් හැඟීමක් ඇතිකර ගැනීමත් සමඟ ම සංවර්ධන අරමුණු හා ගැළපෙන අදහස් උදහස් ඇති කිරීම දෙවැන්න වේ. දෙ වැනි අවශ්‍යතාව ඉතා ම වැදගත් වෙයි. කුමක් හෙයින් ද යත්, සංවර්ධනය සඳහා යොදන ප්‍රාග්ධන ප්‍රමාණයට වඩා සාමාන්‍යයෙන් ජනතාව ලබාගන්නා කාර්මික දැනීම් ප්‍රමාණය මූලික වන හෙයිනි.

(ලකුණු 15 යි)

www.pastpaperlk.com
www.artsapi.lk

[ හතරවැනි පිටුව බලන්න.

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ ව්‍යාකරණානුකූල ව විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.
   (i) රටක සංවර්ධන ක්‍රියාවලියට බාධා පමුණුවන ස්වාභාවික විපත්ති
   (ii) සාහිත්‍යාංගයක් වශයෙන් වර්තමාන ගීත ප්‍රබන්ධවල පවත්නා වැදගත්කම හා අනන්‍යතාව
   (iii) වසංගත රෝග නිවාරණයෙහි ලා පොදු ජනතාවගේ කාර්යභාරය
   (iv) ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධන ගමන්මඟ කෙරෙහි බලපෑම් ඇති කරන බලශක්ති අර්බුදය
   (v) ශ්‍රී ලංකාවේ පැරණි ජනජීවිතය හා බැඳුණු වාපි සංස්කෘතිය
   (vi) කායික - මානසික සමබරතාව කෙරෙහි ක්‍රීඩාව මඟින් ඇතිවන බලපෑම (ලකුණු 25 යි)

4. (අ) පහත සඳහන් වාක්‍යවල **පදෙස් හැඟ ඇතොත් නිදෙස් කොට** ලියන්න.
   (i) මෙබඳු අපරාධ කවුරු හෙළා හො දකියි ද?
   (ii) ගුරුතුමා විසින් අපි දක්නා ලදි.
   (iii) කැහා කැපා පියුම් පොකුණු වූහ.
   (iv) මා සිතුළු කියුදී ඈ අසා සිටියහු ය. (ලකුණු 05 යි)
   (v) දරුවන් දෙමව්පියන්ගේ උපදෙස් පිළිපදින් නම් ඉතා අගනේ ය.

   (ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.
   (i) රාජ්‍ය නායකයා විදේශ තානාපතිවරුන් සේවාවෙන් ඉවත් කරයි.
   (ii) ප්‍රකට ගත්කතුවරු තම ග්‍රන්ථ රචනය සඳහා විවිධ භාෂාරීතීන් භාවිතයට ගත්හ. (ලකුණු 05 යි)
   (iii) සොර මුළ ළමයෙකු පැහැර ගත්හ.
   (iv) විනිශ්චය මණ්ඩල සාමාජිකයෝ ගෞරව සම්මානයකින් මා පුදති.
   (v) හෙතෙම කාතුරකින් කවදාපි කොළ කැපුවේ ය.

   (ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.
   (i) පයින් (යන්නෝ/යන්නන්) දකුණු පයින් ගමන් කළ යුතු ය.
   (ii) ඒ දුම්රියෙහි (කාන්තාවන්/කාන්තාවෝ) උදෙසා වෙන් වූ මැදිරියක් ඇත.
   (iii) ලේකම්තුමා හෝ සභාපතිතුමිය හෝ ඒ උත්සවයට සහභාගි (වන්නේ ය. / වන්නී ය.)
   (iv) (එවන්නෝ / එවන්නන්) දීනාත්මෝ වූ.
   (v) මාර්ටින් (වික්‍රමසිංහයෝ / වික්‍රමසිංහයන්) ගම්පෙරළිය රචනා කළහ. (ලකුණු 05 යි)

5. (අ) පහත දක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.
   (i) **බුදුරජාණන් වහන්සේ** ධරමාන කාලයේ දී ම විවිධ ශාසනික විලෝපන සිදු විය.
   (ii) **ඉච්ඡාභංගත්වයට** පත් තරුණ පිරිස් රට හැර යති.
   (iii) **සමයසමයාන්තර ඥාන වර්ධනය** පිණිස ධර්ම ග්‍රන්ථ කියවීම අතිශයෝපකාරී ය. (ලකුණු 03 යි)

   (ආ) පහත දක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනි පද ලියන්න.
   (i) රජකුගේ ඔටුනු පැළඳවීමේ උත්සවය
   (ii) කැමති අදහස් ඉටු වීම
   (iii) සිඳී - බිඳී විනාශ වූ දේ නැවත සකස් කිරීම (ලකුණු 03 යි)

   (ඇ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.
   (i) සාහිත්‍ය රසවින්දනය හා විචාරය උදෙසා .............................. මාර්ගයක් වෙත ද නිර්දේශ විය යුතු ය.
   (ii) ප්‍රවීණ ගායකයා .............................. වේදිකාව පසු පස හඹා යන්නෙක් නො වේ.
   (iii) ලෝකයේ සමහර රටවල .............................. ප්‍රජාවරත්වයක් නොමැති බව පෙනී යයි.
   (iv) නාළගිරි කණ්ඩායම සභා .............................. උද්දීප්තියට පත් කළහ.
   (v) චීනය හා ඉන්දියාව ආසියාවේ යෝධයන් සේ .............................. සමෘද්ධියට පත්වෙමින් සිටියි.
   (vi) පරාසඳ තරු රැස සමඟ උදවූ නුබ .............................. ආලෝකවත් කළේ ය.
   (ප්‍රබුද්ධ / දේශපාලන / ගර්භය / ප්‍රසිද්ධ / ගැබ / ආර්ථික) (ලකුණු 03 යි)

   (ඊ) තද කළු අකුරින් දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.
   (i) ඔහු **කියත් තල** රැගෙන ගෙන් - ගෙට ගොස් විකුණා ජීවත් විය.
   (ii) හස්තිරාජයා තම **දළ** දෙකෙහා පර්වතයට ඇන්නේ ය.
   (iii) ගත සිත සනසා ගනු පිණිස ඔහු **භාවනාවට** යොමු විය.
   (iv) ගැහැනිය ගමට යනු වස් **බස්රියට** නැගුණා ය.
   (v) අගෝස්තු **මස** 31 දින රජයේ නිවාඩු දවසකි.
   (vi) මුවදෙව්ද වත **ඛණ්ඩ** කාව්‍යයකි. (ලකුණු 06 යි)



www.pastpaperlk.com
www.artsapi.lk

6. තද කළු අකුරින් දක්වා ඇති පද කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි දක්වන්න.
   (i) දක්ෂිණාත්‍ය ගන්ථ කතුවරු ලෙළවමින් ඔහු අභිදර්ශ ලේඛ සටන් කළේ ය.
   (ii) ශ්‍රී ලාංකික ක්‍ෂුද්‍රපත්කලාව වනාහි නව-කාවන් සංවර්ධනය විය යුතු අංශයකි.
   (iii) පැරකුම්බාමහරජ වැඩිඅමුණු හතා සහලින් රට සමෘද්ධිමත් කළේ ය.
   (iv) ගුණානුවණ සිරි ළමාපරපුරක් බිහිකිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ එක් සුවිශේෂ කාර්යයකි.
   (v) වෙසක්පොහොය නිමිත්තෙන් දර්ශනීය තොරණක් ඉදිකර ප්‍රදර්ශනය කරන ලදි. (ලකුණු 15 යි)

7 (අ) පහත දක්වෙන යෙදුම්වලට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.
   (i) කිසියම් වේදනාවක් ඇති කෙනකුට තවත් වේදනාවක් දීම
   (ii) වයසට හෝ තරාතිරමට හෝ නොගැළපෙන ක්‍රියාවක නිරත වීම
   (iii) ඉතා සුළු කරුණකින් පවා කිපීම
   (iv) මහන්සි වූ තරමට ප්‍රතිඵල නොලැබීම
   (v) උදාර සේවයක් සිදුකොට අවසානයේ සුළු වරදක් කිරීම
   (vi) නිෂ්ඵල දෙයක් සඳහා මහන්සි වීම (ලකුණු 03 යි)

(ආ) පහත දී ඇති රූඪිවල අදහස පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.
   (i) ජාඩියට මුඩිය වගේ   (ii) ඉහවහා යාම
   (iii) උඩගෙඩි දීම   (iv) අනුනවයෙන් බේරුණා
   (v) දෙබරෙට ගල් ගැසීම   (vi) ඩැල්වටාරම් දෙඩීම (ලකුණු 03 යි)

(ඉ) පහත දී ඇති එක් එක් යුගල පද සෑදී ඇති රටාව කුමක් දැයි දක්වන්න.
   (i) උදව් - උපකාර   (ii) රෙදි - පෙරෙදි
   (iii) වං - හුං   (iv) ගොඩ - මඩ
   (v) සොයා - බලා   (vi) ඇඳුම් - ආයිත්තම් (ලකුණු 03 යි)

(ඊ) පහත දී ඇති ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද ලියා දක්වන්න.
   (i) වංගිය   (ii) කටගහනවා
   (iii) පාරම්බානවා   (iv) තේලංකඩ
   (v) පාරවිටුව   (vi) පැලපදියං වීම (ලකුණු 03 යි)

(උ) පහත දී ඇති ප්‍රාස්තාවික ව්‍යවහාරයන්ට දිය හැකි පොදු භාවිතයේ යෙදෙන අරුත් ලියන්න.
   (i) අසානායි වීම   (ii) අඩුක්කු
   (iii) බෑන   (iv) අප්පච්චි
   (v) වඩදිය   (vi) ආතුරයා (ලකුණු 03 යි)

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උගතුන්කැතුන්වශයෙන්භාෂාවේදීන්අන්තර්ගතකළයුතුඇතිබවක්වහරෙහිසදෙස්තිදෙස්උචිතඅනුචිතඋපස්පහත්පවතිනබවත් පිළිගතමහායෙඅනුරිත්හිදෙස්වූත්උචිතවූත්උපස්වූත්ලක්ෂණසියවහරෙහියොදන්නෝතමනටඇවසිනිරවුල්වූත්රයවත් වූත්බලවත්වූත්භාෂාරීතියක්නිෂ්පාදනයකරගතිතිසිංහලයඋපස්පංස්කෘතියෙහබාධකයබවටපත්වූයේමෙයටදෙදහස්වසරකට දපෙරයවිෂයයකවරක්වේවාඒපිළිබඳඅදහස්ප්‍රකාශකිරීමේමාධ්‍යයක්වශයෙන්කවරදවුවසිංහලයදුබලතාවක්නොදක්විය දනුදුනොදක්වයිවාක්කෝෂයඑහිලාප්‍රමාණවත්ය

   (i) ඉහත ඡේදය, ශාස්ත්‍රීය යැයි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙදා, විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.
   (ii) රකාරාංශය සහිත පද දෙකක් ඡේදයෙන් උපුටා දක්වන්න.
   (iii) ඡේදයේ සඳහන් ගැට ඇලපිල්ල යංශය අන්තර්ගත වචන දෙකක් ලියා දක්වන්න.
   (iv) ඡේදයේ ඇති "අනුචිත" යන පදයෙහි ඇතුළත් පිල්ලම් නාම කරන්න.
   (v) රකාරාංශය හා රේඵය අන්තර්ගත ඔබ දන්නා පදයක් ලියන්න. (ලකුණු 15 යි)

※ ※ ※